# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 13 දරන විදේශ විනිමය වැරදි කමා කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 මැයි මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 13 දරන විදේශ විනිමය වැරදි කමා කිරීමේ (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 77/71.

**1971 අංක 1 දරන විදේශ විනිමය වැරදි කමා කිරීමේ පනත අතීතයට ද බලපෑම ඇතිව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය සහ මේ පනත ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 13 දරන විදේශ විනිමය වැරදි කමා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හැඳින් වෙන අතර 1971 ජනවාරි මස 21 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යයන් සඳහා සලකනු ලැබිය යුතු ය.

7අ වන අලුත් වගන්තිය 1971 අංක 1 දරන පනතෙහි ඇතුළත් කිරීම.

2. මින් මතු මේ පනතෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1971 අංක 1 දරන විදේශ විනිමය වැරදි කමා කිරීමේ පනතෙහි 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම පනතෙහි 7අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"මේ පනත යටතේ ලබා ගත් ඇතැම් සාක්ෂි විදේශ විනිමය පාලන වැරදි පිළිබඳ නඩුවල දී පිළිගත හැකි බවට අදාළ විශේෂ විධිවිධාන.

7අ. මේ පනත අදාළ වන්නා වූ ද නිසි බලධරයා වෙත තමාගේ විදේශ වත්කම් පිළිබඳ ප්‍රකාශයක් කරන ලද නමුදු එම බලධරයා විසින් තමා වෙත නිකුත් කරන ලද උචිත විධානවලට අනුකූලව ක්‍රියා කර නොමැත්තා වූ ද යම් තැනැත්තකුට විරුද්ධව, විනිමය පාලනය පිළිබඳව තත්කාලයෙහි වලංගුව පවත්නා නීතියෙහි යම් විධිවිධාන කඩ කිරීමක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබූ අවස්ථාවක, 5 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, නැතහොත් ඉහත කී ප්‍රකාශය කිරීමට එම තැනැත්තා ඒ විධිවිධානවලින් පෙළඹුනා විය හැකි වුව ද නො වුව ද, එසේ ම වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, එකී ප්‍රකාශය හා එම තැනැත්තා විසින් එම බලධරයාට දෙන ලද වෙනත් යම් ලේඛනයක් හෝ කරන ලද යම් වාචික හෝ ලිඛිත ප්‍රකාශයක් සාක්ෂි වශයෙන් පිළිගත හැකි වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ (ඊ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඊ) මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට ; හෝ

(උ) (i) විනිමය පාලනය පිළිබඳව තත්කාලයෙහි වලංගුව පවත්නා නීතිය කඩ කිරීමක් සම්බන්ධයෙන්, එම කාරණය අදාළ වන්නා වූ තැනැත්තාට විරුද්ධව අධිකරණයක් හෝ 1972 අංක 14 දරන අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාවක් ඉදිරියේ නඩු පැවරීමේ; හෝ

(ii) විනිමය පාලනයට අදාළව තත්කාලයෙහි වලංගුව පවත්නා නීතියෙහි යම් කඩ කිරීමක් පිළිබඳව පරීක්ෂා කිරීමේ හෝ එම නීතිය අනුව ක්‍රියා කරන බවට වගබලා ගැනීමේ

කාර්යය සඳහා එම කරුණ දැන්වීම අවශ්‍ය යම් තැනැත්තකුට.".